(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 44.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 ජනවාරි මස 26 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ලාල් ග්‍රේරු මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු සිසිර කුමාර අබේසේකර මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝගේෂ්වරන් මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු වමල් රාජපක්‍ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු අලි සාහීර් මවුලානා සෙය්යිඩ් මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම :** පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මුහම්මදු ෂරීෆ් තෞෆික් මහතා 99 (අ) ව්‍යවස්ථාව යටතේ නීති ප්‍රකාර ප්‍රතිඥා දී පොතෙහි අත්සන් කළේය.

**2. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා මතු පළවන නිවේදන කරන ලදී,—

**I**

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා විසින් දරමින් සිටි පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි. එම ලිපිය දැන් කියවනු ලැබේ."

19th January 2016

Secretary General

Parliament

Sri Jayewardenepura

Kotte

Dear Sir,

**<u>Resignation as a Member of Parliament</u>**

This is to inform you that I hereby resign from my seat as a Member of Parliament with effect from today the 19th of January 2016.

I wish to thank you and staff for all the assistance extended to me during the period I served as a Member of Parliament.

Thanking you,

Yours sincerely,

Dr. A.R.A. Hafeez, M.P.

## II

"පාර්ලිමේන්තු මන්ත්‍රී ඉඩම් අමාත්‍ය ගරු එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන මහතාගේ අභාවය මෙම පාර්ලිමේන්තුවට මා දන්වා සිටින්නේ බලවත් කනගාටුවෙනි. එතුමාගේ අභාවයෙන් පාර්ලිමේන්තුවට සිදුවී ඇති පාඩුව ගැන බොහෝසේ දුක්වන අතර මෙම ගරු මන්ත්‍රීවරයාගේ පවුලේ අය වෙත අපගේ සාතිශය සංවේගය ප්‍රකාශ කරන බව මෙම පාර්ලිමේන්තුව වෙනුවෙන් මම දන්වනු කැමැත්තෙමි. මේ පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව මතු දිනකදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත."

## III

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව " පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)" පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් දෙකක පිටපත් මා වෙත ලැබී ඇති බව ස්ථාවර නියෝග අංක 50(2)(අ) යටතේ පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි."

## IV

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව "ක්ෂුද්‍රමූල්‍ය" පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් තුනක පිටපත් මා වෙත ලැබී ඇති බව ස්ථාවර නියෝග අංක 50(2)(අ) යටතේ පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි."

## V

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව "ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) "පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව ස්ථාවර නියෝග අංක 50(2)(අ) යටතේ පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි."

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම : (**1) කථානායකතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වැනි ව්‍යවස්ථාව ප්‍රකාර

(i) 2012 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ හයවැනි කාණ්ඩයේ XXIII වැනි කොටස; සහ

(ii) 2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ VI සහ VII වැනි කොටස්, දෙවැනි කාණ්ඩයේ VIII, IX සහ X වැනි කොටස් සහ පස්වැනි කාණ්ඩයේ II වැනි කොටස

පිළිගන්වන ලදී.

එම වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්,

(i) 2014 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යසාධන වාර්තාව; සහ

(ii) 2012 සහ 2013 වර්ෂ සඳහා වූ මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික කාර්යසාධන වාර්තා සහ වාර්ෂික ගිණුම්

පිළිගන්වන ලදී.

එම වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින්,

(i) 2014 වර්ෂය සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම්;

(ii) 2014 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන සහ ගිණුම් වාර්තාව;

(iii) 2014 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම්;

(iv) 2014 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන හා ගිණුම් වාර්තාව;

(v) 2014 වර්ෂය සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන වාර්තාව සහ ගිණුම්;

(vi) 2014 වර්ෂය සඳහා මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(vii) 2014 වර්ෂය සඳහා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ ගිණුම්;

(viii) 2014 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම්; සහ

(ix) 2014 වර්ෂය සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම්

පිළිගන්වන ලදී.

එම වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(4) අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා විසින්, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වන ලදී.

එම ලිපිලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(5) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා විසින්,

(i) 2013 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්; සහ

(ii) 2013 වර්ෂය සඳහා සී/ස සීනෝර් පදනමේ වාර්ෂික වාර්තාව

පිළිගන්වන ලදී.

එම වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(6) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(7) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල ඇතුළත් 13 සහ 17 වැනි වගන්ති සංශෝධනය කරමින් 2015 නොවැම්බර් 9 දිනැති අංක 1940/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වන ලදී.

එම ලිපිලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම් :**

(1) පොල්ගහවෙල, ගොඩවෙල, යකඩත්තල වත්ත, අංක 40/4 දරන ස්ථානයෙහි පදිංචි එස්. බී. එල්. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු 2015.11.26 දිනැති පෙත්සම ගරු ජෝන් අමරතුංග මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) ගාල්ල, කන්දෙවත්ත පාර, අංක 31/15 ඒ දරන ස්ථානයෙහි පදිංචි ඒ. ආර්. කදීජා බීබි මහත්මියගෙන් ලැබුණු 2015.10.26 දිනැති පෙත්සම;

(ii) අනුරාධපුර, III වන පියවර, පුබුදු මාවත, අංක 3062 දරන ස්ථානයෙහි පදිංචි එච්. එම්. වී. ඩබ්ලිව්. හේරත් මහතාගෙන් ලැබුණු 2015.10.26 දිනැති පෙත්සම;

(iii) ගාල්ල, මඩවලමුල්ල, අසෝක මාවත, අංක 1/43 දරන ස්ථානයෙහි පදිංචි එච්. එච්. තිලකසේන මහතාගෙන් ලැබුණු 2015.10.15 දිනැති පෙත්සම;

(iv) මාතර, නුපේ, ධර්මපාල මාවත, ඇලවේල්ල පාර, අංක 6/16 දරන ස්ථානයෙහි පදිංචි එල්. ඩබ්ලිව්. ගුණදාස මහතාගෙන් ලැබුණු 2015.10.17 දිනැති පෙත්සම;

(v) අම්බලන්ගොඩ, රොන්නදූව, අළුත්වල පාර, "සාගර" යන ලිපිනයෙහි පදිංචි එම්. කේ. අසෝක කුලසේකර මහතාගෙන් ලැබුණු 2015.11.19 දිනැති පෙත්සම; සහ

(vi) හික්කඩුව, වැවල, ගාලු පාර, අංක 431 දරන ස්ථානයෙහි පදිංචි යූ. එම්. සූරිආරච්චි මෙනෙවියගෙන් ලැබුණු 2015.11.02 දිනැති පෙත්සම

ගරු වජිර අබේවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) වැබඩ, කිරිල්ලවත්ත, අංක 39 දරන ස්ථානයෙහි පදිංචි පැරකුම් සුජාන් මොණරාගල මහතාගෙන් ලැබුණු 2015.11.23 දිනැති පෙත්සම; සහ

(ii) ඉඟිනියාගල පොලිස් ස්ථානයේ සේවය කරන උප පොලිස් පරීක්ෂක එස්. බී. දිසානායක මහතාගෙන් ලැබුණු 2015.12.23 දිනැති පෙත්සම

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) මුදුන්ගොඩ, වතුරුගම පාර, චාමර උයන, අංක 7 දරන ස්ථානයෙහි පදිංචි එස්. කේ. චිත්‍රාකාන්ති මහත්මියගෙන් ලැබුණු 2015.12.15 දිනැති පෙත්සම; සහ

(ii) ගාල්ල, හැව්ලොක් පාර, අංක 5 දරන ස්ථානයෙහි පදිංචි යූ. ඩී. ආර්. පී. කුලතිලක මෙනෙවියගෙන් ලැබුණු 2015.10.10 දිනැති පෙත්සම

ගරු ගයන්ත කරුණාතිලක මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) මාතලේ, මීවත්තේකුඹුර පාර, අංක 71 දරන ස්ථානයෙහි පදිංචි (වෛද්‍ය) ඒ. ගෝබික්‍රිෂ්ණ මහතාගෙන් ලැබුණු 2015.11.07 දිනැති පෙත්සම;

(ii) මඩකලපුව රජයේ ගුරු විද්‍යාලයේ ඩී. ජී. නිමල් ශාන්ත මහතාගෙන් ලැබුණු 2015.12.07 දිනැති පෙත්සම;

(iii) හඳුන්ගමුව, 19 කොටස, අංක 705 දරන ස්ථානයෙහි පදිංචි ඩී. එම්. සුනිල් ජයතිස්ස මහතාගෙන් ලැබුණු 2015.12.12 දිනැති පෙත්සම; සහ

(iv) මිල්ලවාන, අම්බොක්ක, අංක 339 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. එම්. විජේතුංග මහතාගෙන් ලැබුණු 2015.12.12 දිනැති පෙත්සම

ගරු වසන්ත අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) හෝමාගම, ගලවිලවත්ත, සමන් මාවත යන ලිපිනයෙහි පදිංචි ඩී. ඒ. ජේමසිරි මහතාගෙන් ලැබුණු 2015.11.30 දිනැති පෙත්සම;

(ii) දොම්පේ, පැලහැල, අංක 80/1 දරන ස්ථානයෙහි පදිංචි කේ. කේ. ධර්මසේන මහතාගෙන් ලැබුණු 2015.10.12 දිනැති පෙත්සම;

(iii) පේරාදෙණිය, හේන්දෙනිය, අංක 19 දරන ස්ථානයෙහි පදිංචි කේ. එම්. වීරසේන මහතාගෙන් ලැබුණු 2015.11.23 දිනැති පෙත්සම;

(iv) කඩවත, පහළ බියන්විල, අංක 136/2 F දරන ස්ථානයෙහි පදිංචි පී. එස්. කේ. ජයකොඩි මහතාගෙන් ලැබුණු 2015.12.16 දිනැති පෙත්සම; සහ

(v) දෙකටන, නැළුම් මහර, අංක 90/5 දරන ස්ථානයෙහි පදිංචි ප්‍රදීප් ලංකා ධර්මවික්‍රම මහතාගෙන් ලැබුණු 2015.10.22 දිනැති පෙත්සම

ගරු අනුර දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(7) (i) පේරාදෙණිය, අඟුනාවල, අංක 201 දරන ස්ථානයෙහි පදිංචි බී. එම්. ඩී. බී. බස්නායක මහතාගෙන් ලැබුණු 2015.11.15 දිනැති පෙත්සම; සහ

(ii) උඩදුම්බර, පෝප්පිටිය, පනවැල්උල්ල, අංක 08 දරන ස්ථානයෙහි පදිංචි කේ. එම්. කුලතුංග මහතාගෙන් ලැබුණු 2015.11.07 දිනැති පෙත්සම

ගරු ලකී ජයවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) වෑ උඩ, මල්ලියගොඩ යන ලිපිනයෙහි පදිංචි එස්. ඩී. නිමල් චන්ද්‍රසිරි පෙරේරා මහතාගෙන් ලැබුණු 2015.12.13 දිනැති පෙත්සම; සහ

(ii) දොරටියාව, මැස්සගම්මන යන ලිපිනයෙහි පදිංචි එස්. කේ. සරත් කුමාර මහතාගෙන් ලැබුණු 2015.12.21 දිනැති පෙත්සම

ගරු ජේ. සී. අලවතුවල මහතා විසින් පිළිගන්වන ලදී.

(9) (i) රත්මලාන, බොරුපන පාර, මාර්ග සංවර්ධන අධිකාරිය, ග්‍රාමීය පාලම් අංශය යන ලිපිනයෙහි සේවය කරන ඒ. ඩබ්ලිව්. සී. ටී. පීරිස් මහතාගෙන් ලැබුණු 2015.12.17 දිනැති පෙත්සම; සහ

(ii) හොරණ, කුඩාඋඩුව, දකුණු උඩුව, කපුමුල්ල යන ලිපිනයෙහි පදිංචි පී. කේ. නන්දදාස මහතාගෙන් ලැබුණු 2015.12.18 දිනැති පෙත්සම

ගරු ජයන්ත සමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(10) (i) ගාල්ල, උළුවිටකේ, කිතුලම්පිටිය, එදිරිසිංහ මාවත, අංක 184/1 දරන ස්ථානයෙහි පදිංචි ජී. ගොඩගේ මහතාගෙන් ලැබුණු 2015.08.23 දිනැති පෙත්සම;

(ii) මාතර, වෙහෙරහේන, විහාර මාවත, "ප්‍රබෝධ" යන ලිපිනයෙහි පදිංචි එස්. කේ. දයානන්ද මහතාගෙන් ලැබුණු 2015.10.01 දිනැති පෙත්සම; සහ

(iii) ගාල්ල, වැකුණගොඩ පටුමග, අංක 05 දරන ස්ථානයෙහි පදිංචි එස්. එස්. යූ. හෙට්ටිආරච්චි මහතාගෙන් ලැබුණු 2015.09.11 දිනැති පෙත්සම

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(11) කුණ්ඩසාල, විජේරාම මාවත, අංක 7 දරන ස්ථානයෙහි පදිංචි ආර්. එච්. ජයවර්ධන මහතාගෙන් ලැබුණු 2015.11.27 දිනැති පෙත්සම ගරු සුජිත් සංජය පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(12) (i) කොළොන්නාව, විජය පාර, අංක 1/10 දරන ස්ථානයෙහි පදිංචි ආනන්ද කළුආරච්චි මහතාගෙන් ලැබුණු 2015.09.30 දිනැති පෙත්සම;

(ii) මුල්ලේරියාව නව නගරය, ගොන්නගහවිට, රජයේ නිවාස, අංක 05 දරන ස්ථානයෙහි පදිංචි බී. ඒ. සිරියානන්ද මහතාගෙන් ලැබුණු 2015.11.26 දිනැති පෙත්සම; සහ

(iii) කතරගම, සෙල්ල පාර, අංක 44 දරන ස්ථානයෙහි පදිංචි එච්. ඩී. පී. එම් ජයසිංහ මහතාගෙන් ලැබුණු 2015.10.14 දිනැති පෙත්සම

ගරු එස්. එම්. මරික්කාර් මහතා විසින් පිළිගන්වන ලදී.

(13) ගම්පහ, අස්ගිරිය, අංක 57/2/1, "රන්දික" යන ලිපිනයෙහි පදිංචි කමලා නන්දනී විජේගුණරත්න මහත්මියගෙන් ලැබුණු 2015.12.12 දිනැති පෙත්සම ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින් පිළිගන්වන ලදී.

(14) (i) මාතලේ, කටුදෙණිය, වාරියපොල, අංක 126/39 දරන ස්ථානයෙහි පදිංචි ඩී. එම්. විජිත මල්ලිකා මහත්මියගෙන් ලැබුණු 2015.09.23 දිනැති පෙත්සම;

(ii) රත්තොට, ගම්මඩුව පාර, අංක 12/2 දරන ස්ථානයෙහි පදිංචි ඩී. ඩබ්ලිව්. ජී. ගුණවතී මහත්මියගෙන් ලැබුණු 2015.12.22 දිනැති පෙත්සම; සහ

(iii) පේරකනත්ත, විල්ගමුව, ඉමාඩුවයාය, අංක 151/1 දරන ස්ථානයෙහි පදිංචි ර්. ජී. කපිලරත්න මහතාගෙන් ලැබුණු 2015.11.09 දිනැති පෙත්සම

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් පිළිගන්වන ලදී.

අංක 25 අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) :** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2016 පෙබරවාරි මස 09 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ අංක 7 දරන ස්ථාවර නියෝගයෙහි, 2015.10.06 සහ 2016.01.09 වැනි දිනයන්හිදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන්ව තිබුණද, 2015.12.19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුව රැස්වන අද දින, රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 2.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2015.10.06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2016 ජනවාරි මස 29 වැනි සිකුරාදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු අතර, එදින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.30 සිට අ. භා. 7.30 දක්වා විය යුතුය. අ. භා. 6.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු බුද්ධික පතිරණ මහතා, ගරු කේ. කේ. පියදාස මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව, — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රුහුණු උද්‍යානය සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**9. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු බුද්ධික පතිරණ මහතා, ගරු කේ. කේ. පියදාස මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව, — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

" "මාතර සමය" සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**10. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු විජිත බේරුගොඩ මහතා, ගරු කනක හේරත් මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව, — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"හේදන් අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**11. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය, ගරු කනක හේරත් මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව, — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**12. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය, ගරු කනක හේරත් මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව, — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මෛත්‍රීපාල සේනානායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**13. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය, ගරු කනක හේරත් මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව, — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ගුණරතන ජාත්‍යන්තර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**14. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු කනක හේරත් මහතා, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය වෙත පවරන ලදී.

**15. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව, — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා පරිගණක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**16. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව, — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"දයා සරණ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**17. කල් තැබීම (2015 දෙසැම්බර් 19 වැනි දින පාර්ලිමේන්තුව අනුමත කළ ගිවිසුම්) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(අ. භා. 2.10 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි විදේශ කටයුතු අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.50 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.50 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 6.05 ට, 2016 ජනවාරි මස 09 වැනි දින සභා සම්මතිය අනුව, 2016 ජනවාරි මස 27 වැනි බදාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.